# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2003 අංක 4 දරන මුදල්
## (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2003 පෙබරවාරි මස 27 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2003 පෙබරවාරි මස 28 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 4.25 යි. තැපැල් ගාස්තුව : රු. 4.50 යි.

## 2003 අංක 4 දරන මුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2003 පෙබරවාරි මස 27 වන දින]

එල්. ඩී.—ඕ. 55/2001.

### 1995 අංක 16 දරන මුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2003 අංක 4 දරන මුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1999 අංක 24 දරන පනතින් සංශෝධිත 1995 අංක 16 දරන මුදල් පනතේ I වන පරිච්ඡේදයේ I වන කොටස (2 වන වගන්තිය) මෙයින් ඉවත් කරනු ලැබේ. — 1995 අංක 16 දරන පනතේ I වන පරිච්ඡේදයේ I වන කොටස ඉවත් කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— — ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) "ඩීසල් මෝටර් වාහන බද්ද, සුඛෝපභෝගී මෝටර් වාහන බද්ද" යන වචන වෙනුවට "සුඛෝපභෝගී මෝටර් වාහන බද්ද" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ පැති සටහනෙහි "ඩීසල් මෝටර් වාහන බද්ද, සුඛෝපභෝගී මෝටර් වාහන බද්ද" යන වචන වෙනුවට "සුඛෝපභෝගී මෝටර් වාහන බද්ද" යන වචන ආදේශ කිරීමෙන්.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියේ "නිශ්චිත මෝටර් වාහන" යන යෙදුමෙහි අර්ථ නිරූපණය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— — ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

"නිශ්චිත මෝටර් වාහනය" යන්නෙන්, යම් සුඛෝපභෝගී මෝටර් වාහනයක්, යම් අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහනයක් හෝ යම් අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනයක් අදහස් වේ ;".

5. මේ පනතින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධන සියලු කාර්ය සඳහා 2001 ඔක්තෝබර් මස 12 වන දින සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය. — අතීතයට බලපෑම.

6. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. — අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ **අධිකාරී** වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා **පසුව එළඹෙන එක්** එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.